109

44

2023.07.05

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ සඳහා අයදුම්කරන ලද තැනැත්තෙකු විසින් අභියාචනයක් ඉදිරිපත් කිරීමේදී පරිගණක පද්ධතියට පිවිසීම සඳහා ඔහුගේ හෝ ඇයගේ ගෘහ ඒකක අංකය ඇතුළත් කළ යුතු වේ. ඉන්පසු එම තැනැත්තාගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමට සිදු වේ. ජාතික හැඳුනුම්පතක් නොමැති නම් උපන්දිනය ඇතුළත් කර ඊට පිවිසිය හැක. එසේත් නොමැති නම් සිය ජංගම දුරකථන අංකය ඇතුළත් කිරීමෙන්ද පිවිසිය හැක.

අයදුම් කිරීමේදී හා සංගණනයේදී දත්ත ඇතුළත් කිරීමේදී ඇති වූ යම් යම් අඩු පාඩු නිසා පහත සඳහන් තත්ත්වයන් දත්ත පද්ධතිය තුළ පවතින අවස්ථාවන්ද අභියාචනා ඉදිරිපත් කිරීමේදී මතුව ඇති බව අනාවරණය වී ඇත.

1. පද්ධතිය තුළ ජාතික හැඳුනුම්පත් අංකයක් හෝ උපන්දිනය හෝ ජංගම දුරකථන අංකයක් නොමැති වීම.
2. වැරදි ජාතික හැඳුනුම්පත් අංකයක් ඇතුළත්ව තිබීම.
3. ජාතික හැඳුනුම්පත් අංකයක් ඇතුළත්ව නොමැති අතර උපන්දිනය වැරදි ලෙස ඇතුළත්ව තිබීම.

ඉහත අංක 1හි සඳහන් අවස්ථාවකදී අදාළ පුද්ගලයාගේ අනන්‍යතාවය ග්‍රාම නිළධාරි මගින් හෝ වෙනත් විශ්වසනීය මාධ්‍යයක් මගින් තහවුරු කරගෙන ප්‍රාදේශීය ලේකම් විසින් නිවැරදි ජාතික හැඳුනුම්පත් අංකය පද්ධතියට ඇතුළත් කර අභියාචනය සඳහා අවශ්‍ය ඉඩකඩ සලසා දිය හැකියි. ජාතික හැඳුනුම්පතක් නොමැති නම් උපන්දිනයද උපන්දිනය තහවුරු කර ගත නොහැකි නම් ජංගම දුරකථන අංකයද එසේ ඇතුළත් කළ හැක. එය ප්‍රාදේශීය ලේකම්ගේ වගකීම මත සිදුවන කාර්යයක් විය යුතුයි.

ඉහත අංක 2හි සඳහන් තත්ත්වයකදී සටහන් කිරීමේ දෝෂයක් හේතුවෙන් සිදු වූ සුළු වරදක් නම් නිවැරදි ජාතික හැඳුනුම්පත් අංකය තහවුරු කරගෙන ප්‍රාදේශීය ලේකම් විසින් එම අංකය සංශෝධනය කළ හැකියි. එහෙත් ඇතුළත්ව ඇති අංකයේ සංශෝධනයක් මිස සම්පූර්ණයෙන් වෙනස් අංකයක් ඇතුළත් වන සේ සංශෝධනය සිදු නොකළ යුතුයි.

ඉහත අංක 3හි සඳහන් තත්ත්වයක් යටතේ ජාතික හැඳුනුම්පතක් තිබේ නම් එම අංකය ඇතුළත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් සංශෝධනයක් සිදු කළ හැකිය. එහෙත් උපන්දිනය මෙම අවස්ථාවේදී සංශෝධනය කළ නොහැකි හෙයින් පවත්නා උපන්දිනය අභියාචනාකරුට ලබා දී එම දත්තය ඇතුළත් කර පිවිසීමට උපදෙස් දිය හැකියි.

අතිරේක කොමසාරිස් (මෙහෙයුම්)
කොමසාරිස් වෙනුවට
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය